

# ශ්‍රී ලංකාවේ මිනිස් අලි ගැටුම

ජයන්ත ජයවර්ධන



## මූලාරම්භය

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම වූ බුදු දහමේ අලින්ට හිමිවන්නේ ප්‍රධාන තැනකි. මහාමායා දේවිය සිද්ධාර්ථ කුමාරයා පිළිසිඳ ගැනීමට ප්‍රථම සුදු ඇත් පැටවකු සිහිනෙන් දුටු බව එහි සඳහන් වේ. පසු කලක බුද්ධත්වයට පත්වූ සිද්ධාර්ථ කුමාරයා ගෞතම බුද්ධ නමින් ලෝක ගෞරවයටද පාත්‍ර විය. හින්දු භක්තිකයන් ද අලින්ට මහත් සැලකිලි දක්වති. ඔවුන් අදහන ගණ දෙවියාට ද ඇත්තේ හස්තියෙකුගේ හිසකි.

## ඓතිහාසික පසුබිම

මිනිසා සහ අලියා අතර සම්බන්ධය ඉතා ඈතට විහිදේ. මුල්ම වාර්තා අනුව ක්‍රි. පූර්ව 2000 දී පමණ ඉන්දියානුවන් විසින් අලින් හීලෑ කර වැඩ ගත් බව සඳහන්ව ඇත. හිටපු වන ජීවී අධ්‍යක්ෂ ලීන් ද අල්විස් මහතාගේ මතයට අනුව පුරාණ දඩයක්කාරයින් විවිධ සතුන් වර්ග මස් පිණිස ආහාරයට ගන්නා අතර, එසේ මරණ ලද අලින්ගේ කුඩා අලි පැටවුන් සුරතලයට ඇති කිරීම පිණිස ගෙනෙන්ට ඇත. විශාල අලින් පාලනය කිරීම සඳහා විශාල පරිශ්‍රමයක් දැරීමට ද සිදු වුවත් අලියා ඉතා කීකරු හා හික්මවිය හැකි සතෙකු නිසා පාලනය කිරීම පහසු වන්නට ඇත. මුල් කාලයේදී ඔවුන්ගෙන් සුළු වැඩ ගත් අතර පසුව ඔවුන් බර වැඩ සඳහා යොදා ගන්නට ඇත.

අලියාත් මිනිසාත් අතර පැවැති සමීපතාවය පිළිබඳව මුල්ම වාර්තා හමුවන්නේ ආසියාවෙනි. ආසියාවේ ඊජිප්තුව (එකල මිසපොතේමියාව) සිට ඉන්දියාව, ශ්‍රී ලංකාව, මියන්මාර (පෙර බුරුමය), තායිලන්තය (එකල සියමය) සහ චීනය දක්වා වේ. ආසියානු අලියා (*Elephas Maximus*) අප්‍රිකානු අලින්ට(*Loxdonta africana*) සහ (*Loxdonta cyclotis*) වඩා පහසුවෙන් හික්මවිය හැකි ය. ඒ කෙසේ වුවත් අප්‍රිකානු අලියාට වඩා ආසියාවේ අලින් සහ මිනිසුන් අතර පැවැති සම්බන්ධය ඓතිහාසික වාර්තා මගිනුත් සනාථ වේ. එමෙන්ම ආසියානු ජාතිකයන්ගේ වාසස්ථාන වනාන්තරවල ජීවත්වන අලින්ගේ නිජබිම වලට කිට්ටුව පිහිටා තිබුණි. අප්‍රිකානු වනාන්තර ඉතා විශාලයි. එබැවින් අලින්ගේ වාසස්ථාන වලට සමීපයෙන් ජීවත්වනුයේ ඉතා සුළු පිරිසකි. ඒ කෙසේ වුවත් අල්ලාගන්නා ලද අප්‍රිකානු අලින් නයිල් නිම්නයේදී හීලෑ කරගත් බවට වාර්තා වලින් පැහැදිලි වේ.

ඈත පුරාණයේ පටන් වනාන්තරයෙන් අල්ලා ගන්නා ලද අලින් හීලෑ කර මිනිසාගේ ප්‍රයෝජනය සඳහා යොදා ගත් බව පෙණේ. මෙම සම්බන්ධයේ ප්‍රතිඵලයක් ලෙස මිනිසාත් අලියාත් අතර දිගු සම්බන්ධයක් ගොඩ නැගුණි.

හීලෑ කරන අලින් නොයෙකුත් ප්‍රයෝජනය සඳහා යොදා ගන්නා ලදී. ශ්‍රී ලංකාව ආසන්නයේ පිහිටි ඉන්දියාවෙන් පැමිණෙන ආක්‍රමිකයන් සමග යුද්ධ කිරීම සඳහා රජවරු අලින් යොදා ගන්නා ලදී. වෙරළ බඩ තීරය අල්ලාගෙන සිටි පෘතුගීසීන්ට සහ ලන්දේසීන්ට පහර දීම සඳහාත් අලින් යොදාගත් බව පෙණේ. යුධ උපකරණ ප්‍රවාහනය මෙන්ම උඩරට රාජධානිය පරසතුරන්ගෙන් ආරක්ෂාකර ගැනීම සඳහා ද අලින් යොදා ගන්නා ලද බව සඳහන් වේ.


පැරණි රජවරු උත්සව හා පෙරහැරවල් සඳහා අලින් යොදා ගනිමින් ඉතා අභිමානවත්ව ගමන් ගත්හ. වෙළඳ ගනුදෙනු සහ මිත්‍ර සම්බන්ධතා පැවැත්වූ නොයෙකුත් රටවල රජවරුන් සහ ප්‍රභූන්ට තෑගි වශයෙන් අලි ඇතුන් පිරිනමන ලදී. අලින් වෙළඳාම සඳහා ද යොදා ගන්නා ලදී. බොහෝ විහාරස්ථාන වල අලි ඇතුන් සිටි අතර, විවිධ ආගමික උත්සව, විශේෂයෙන් පෙරහැරවල් වැනි සංස්කෘතික කටයුතු සඳහා, යොදා ගන්නා ලදී. සිංහල රජ සමයේදී අලි ඇතුන් විදේශ රටවලට යැවූ අතර, ඔවුන් උත්සව සහ පෙරහැරවල් වැනි කටයුතු සඳහා යොදා ගෙන ඇත.

අලින්ගෙන් අතීතයේදී ප්‍රයෝජන රාශියක් ලබා ගත් බව පෙනේ. ඒ අතර කෘෂිකර්ම කටයුතු, කැලෑ එළිපෙහෙළි කිරීම, බර ඉසිලීම, කුඹුරු සී සෑම වැදගත් වේ. ඉංග්‍රීසි ජාතිකයින් විසින් කෝපි, තේ සහ සින්කෝනා වගා කිරීම සඳහා කඳු සහිත වනාන්තර එළි කිරීමට අලින් යොදාගෙන ඇත.

ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා පැරණි රජවරුන් විසින් අලින් ද උපයෝගී කරගත් බව පෙණේ. පොලොන්නරුව, අනුරාධපුරය, ආදී ස්ථානවල දක්නට ඇති පුරාවිද්‍යා නටබුන් පරීක්ෂා කිරීමේදී ඒවා තැනීමට යොදාගත් විශාල ගල් එසවීම අලින් නොමැතිව කල නොහැකි බව බොහෝ දෙනාගේ පිළිගැනීමයි.

අනුරාධපුරයේ මහා ස්තූප වැනි සිද්ධස්ථාන ඉදිකිරීමේදී අත්තිවාරම් සඳහා අලින් විසින් කුඩු කරන ලද ගල් යොදා තිබේ. එහිදී අලින්ගේ ඉදිරිපාද





දෙක තුවාල වීම වලක්වා ගැනීම පිණිස සණ සම් කවර දෙකකින් ආවරණය කර ඇත. යෝධ ජලාශ ඉදි කිරීමේදී පස් ඉවත් කිරීම සඳහා අලින් ප්‍රයෝජනයට ගත් බව සඳහන් වේ.

බොහෝ සිංහල රජදරුවන් විසින් අලි ඇතුන් විශාල ප්‍රමාණයක් යුද්ධ සඳහා යොදා ගැනීමට ගාල්කර තැබූ බව වංශකතාවල සඳහන් ය. පළමුවෙනි රාජසිංහ රජතුමා කොළඹ ලන්දේසි බලකොටුව අල්ලා ගැනීම පිණිස ක්‍රි. ව. 1587/88 දී පමණ අලි 2000ක් පමණ රඳවාගෙන සිටිය බව අනාවරණය වී ඇත.

## වන අලි ඇල්ලීමේ ක්‍රම

ශත වර්ෂ ගණනාවක සිට අලි ඇල්ලීම පිණිස විවිධ ක්‍රම උපයෝගී කර ගෙන ඇත. හීලෑ කරන ලද අලින් වල් අලින් ඇල්ලීම සඳහා යොදාගත් බව 1681 දී රොබට් නොක්ස් සඳහන් කර තිබේ. ඇල්ලීමට අවශ්‍ය අලින් තෝරා ගැනීමේදී වැඩි අවධානයක් ලැබුනේ ඇතුන්ටය. එබැවින් අල්ලා ගැනීමට අවශ්‍ය වල් අලින් වෙත රජුගේ ඇත්ගාලෙන් ඇතින්නියන් යවනු ලැබේ. මෙම ඇතින්නියන් කැලෑ අලින් සමග එකට හැසිරෙන අතර යම්කිසි සංඥාවක් දුන් පසු ආපසු ඒමට ඔවුන් පුරුදු කර තිබේ. ඔවුන් පැමිණෙන විට පෙමින් බැඳුනු වල් අලි ද ගම් නියම් පසු කරමින් ඔවුන් සඳහා විශේෂයෙන් සාදන ලද රක්ෂිත ඇත් ගාලට ඇතුල් වේ.

හීලෑ කරන ලද අලි මගින් වල් අලි ඇල්ලීම සඳහා පුරාණ අවධියේ හීලෑ අලින් එහා මෙහා යන නිදහස් ස්ථානයන් තෝරාගෙන තිබේ. ආහාර ඇති හෙයිනුත් මිනිසුන්ගෙන් හිරිහැරයක් නොමැති හෙයින් අලින් ක්‍රමයෙන් එයට ඇතුල් වේ. ඉන්පසු පුහුණු කල අලි අල්ලන්නන් විසින් තොණ්ඩු දමා වල් අලි අල්ලා ගැනේ.

රොබට් නොක්ස් විස්තර කරන අන්දමට, අනෙක් ක්‍රම දෙක නම් මදු යොදා ඇල්ලීම සහ කොටුවකට අලින් පන්නා අල්ලා ගැනීමයි. බොහෝ කාලයකට පෙර බොරු වලක් උපයෝගී කරගෙන අලි අල්ලා ගන්නා ලදී. ඒ සඳහා අලින් ගමන් කරන මාර්ගයක වලක් කපා එය කොළ වලින් වසනු ලැබේ. ඒ අසලින් තවත් වලක් කපා එය නොවසා තබයි. එසේ කරන්නේ අලියා රැවටීමටය. එහිදී අලියා එම වලේ නොවැටීමට ප්‍රවේසම් වුවත් කොළ වලින් වසා දමන ලද වලට ඇද වැටේ. මෙම ක්‍රම මගින් අලින්ට තුවාල වන නිසා එය නවතා දමන ලදී.

අලින් අල්ලා ගැනීම සඳහා තවත් උපක්‍රමයක් ලෙස අලි නිතර ගැවසෙන මාර්ගයන්හි තොණ්ඩුවක් දමනු ලැබේ. ඒ සඳහා අලියාගේ පාදයට වඩා මදක් විශාල තොණ්ඩුවක් එක් කෙලවරක් ශක්තිමත් ගසක ගැට ගසනු ලැබේ. එහිදී අලියා අඩි තබන විට තොණ්ඩුව හිර වේ. එවිට අලි අල්ලන්නන් පැමිණ ඔවුන්ගේ අනෙක් පාද ද ගැට ගසනු ලැබේ.

එමෙන් ම තවත් ක්‍රමයක් ලෙස අලි අල්ලන්නන් අලියාගේ පිටු පස පාදයකට තොණ්ඩුවක් දමා එහි අනෙක් කෙළවර ගෝනෙකුගේ හෝ මුවෙකුගේ අං තට්ටුවක ගැට ගසනු ලැබේ. එවිට අංතට්ටුව ගසක හෝ මුලක හිර වූ පසු අලි අල්ලන්නන් විසින් අලියාගේ අනෙක් පාදයටද තොණ්ඩු දමා පසුව අලියා අල්ලා ගනු ලැබේ.

බොහෝ අලි අල්ලන්නන් නැගෙනහිර වෙරළබඩ පදිංචි මුස්ලිම් ජාතිකයන්ය. ඔවුන් පනික්කියන් සහ පනික්කිවරු වශයෙන් හැඳින්වූහ. ඔවුන් අලි ඇල්ලීමේ විශේෂඥයින් වූ අතර නිර්භීත කමින් ද අගතැන්පත්ය. පනික්කිවරු අලි ඇල්ලීමේදී ඉහත සඳහන් ක්‍රම අනුගමනය කළහ. අලි ඇල්ලීම තහනම් කිරීමත් සමග පනික්කිවරුන්ගේ තොණ්ඩු දමා අලි ඇල්ලීමේ ක්‍රමයද අභාවයට ගොස් ඇත. ඔවුන් නැවතත් ඔවුන්ගේ මුල්ම රැකියාව වූ ගොවිතැනට යොමු වූහ.

ඉහත සඳහන් අලි ඇල්ලීමේ ක්‍රම අවාසිදායක වූයේ වරකට එක් අලියෙකු පමණක් ඇල්ලීම නිසාය. වලවල් මගින් අලි ඇල්ලීමේ ක්‍රමයෙන් ඔවුන්ට තුවාල සිදු වූ අතර, ඇතැම් විට අබ්බගාතයන් බවට ද පත්වූහ. රොබට් නොක්ස් සඳහන් කරන අන්දමට අලින් ගාල්කර ඇල්ලීමේ ක්‍රමයෙන් අලින් වැඩි ප්‍රමාණයක් එක්වර අල්ලා ගන්න පුළුවන් වුවත් මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා විශාල පිරිසක් අවශ්‍යවේ. එමෙන්ම ගාල්කර ඇල්ලීමේ ක්‍රමය මගින් අලින් විශාල වශයෙන් මියයන අතර ඒ සඳහා අධික වියදමක් සහ මිනිස් ශ්‍රමයක් අවශ්‍ය විය.

## ගැටුමට හේතු

ජනගහනය වැඩිවීමත් සමග ඉඩම් සඳහා ඉල්ලුමද ඉහල යනු දක්නට ලැබේ. මෙයින් අදහස් වන්නේ අලින්ගේ වාසස්ථාන මිනිස් වාසය සඳහා එලිපෙහෙලි වන බවයි. ඔවුන්ගේ වාසභූමි අඩුවූ විට ආහාර සොයා ගැනීමත් අපහසු වේ. එබැවින්


වල් අලි වියලි කාලයේදී ආහාර සොයා කැලෙන් එලියට පැමිණෙති. එසේ පැමිණි ගොවියන්ගේ කෘෂි බෝග විනාශ කරති. අලින්ගෙන් තම භෝග වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා ගම්වාසීන් නොයෙකුත් ක්‍රම යොදන අතර ඉන් අලි මිනිස් ගැටුම ආරම්භ විය.

ගොවීන් එකතු වී තම භෝග ආරක්ෂා කර ගැනීම සඳහා බොහෝ උත්සාහ දරති. බෙර, හේවිසි, ආදිය විශාල හඬක් ඇතිවන ආකාරයට ශබ්ද කරවයි. රාත්‍රී කාලයේ පැමිණෙන අලින් සඳහා ගිණි ගොඩවල් ගසන ලදී. එහෙත් මෙම ක්‍රම සාර්ථක නොවූ නිසා ගොවීන් හට තුවක්කු අතට ගැනීමට සිදු විය. නියමිත ආකාරයට අවි ආයුධ පරිහරණය නොකිරීම හේතු කොට ගෙන එමගින් අලින්ට විශාල වශයෙන් හානි සිදුවී අවසානයේදී ඔවුන් මරණයට පත් විය.

තාවකාලික වශයෙන් අලි පන්නා දැමුවත් ඔවුන් නැවත සුපුරුදු ප්‍රදේශ වෙත පැමිණෙති. ගොවියන්ගේ වෙඩි තැබීම් මගින් බොහෝ අලින් නපුරු සහ දරුණු බවට පත්වේ. ඇතැම් විට ගොවීන් ද ජීවිතක්ෂයට පත්වේ. බොහෝ අලින් වෙඩි තැබීම් වලින් සිදුවූ තුවාල සහ වේදනාව නිසාත් දරුණු තත්ත්වයට පත්වේ. ඇතැම් තුවාල වලින් අලි මරණයට ද පත් වෙති.


පහත සඳහන් ප්‍රස්ථාරයෙන් ජන ගහණය වැඩි වූ ආකාරයත් වනාන්තර ප්‍රමාණය අඩුවූ ආකාරයත් පෙන්නුම් කෙරේ.

### වැඩි වන මිනිස් ජනගහනයත් වනාන්තර අඩුවීමත් අතර සම්බන්ධතාව




පුරාණ කාලයේ මිනිසා වනාන්තර තුළ තිබූ කුඩා ගම්මාන වල වාසය කළ අතර, ඔවුන් වනාන්තර වල සිට අලි ඇතුන් සමග වාසය කිරීමට හුරු පුරුදුව සිටියහ. එමෙන්ම ඔවුන් වගාකටයුතු සිදු කලේ වර්ෂා කාලයේදීය. එම කාලයේදී ආහාර හිඟයක් වනයේ නොතිබූ බැවින් ආහාර සොයා යාමට අලින්ට අවශ්‍යතාවයක් නොතිබිනි. වියළි දේශගුණය පැමිණි විට අලින් කෑම සොයා පැමිණියත් ගොවීන් අස්වැන්න නෙලාගෙන අවසන් හෙයින් ගැටුමක් ඇති වූයේ නැත. ඒ කෙසේ වුවත් ගම්වාසීන් එකතු වී රාත්‍රිකාලයේදී පැමිණෙන අලින්ගෙන් ඔවුන්ගේ වගාවන් ආරක්ෂා කර ගත්හ. නමුත් පසුකාලයේදී වගා ආරක්ෂක කටයුතු සිදු කරන ලද්දේ වනයට ආසන්නව ජීවත්වෙන ගොවීන් පමණක් වේ. එබැවින් වනයෙන් ඈත්ව ජීවත්වෙන ගොවීන්ගේ හට ඔවුන්ගේ වගාවන් ආරක්ෂා කර ගැනීමට අවශ්‍යතාවයක් නොතිබිණි.

### මිනිස් සහ අලි මරණ 1992-2001




මෙම රූප සටහනෙන් අලි මිනිස් ගැටුමෙන් මරණයට පත්වූ මිනිසුන්ගේ සංඛ්‍යාවත්, මරා දමන ලද අලින්ගේ ගණනත් දැක්වේ. අලින්ගේ මරණ සංඛ්‍යාවේ වැඩිවීමක් පෙන්නුම් කරයි. වසරකට අවම වශයෙන් අලින් 120ක් මරා දමා ඇති අතර අලින් විසින් මිනිසුන් 65 දෙනෙකු වර්ෂයකට මරා දමන බවත් පෙනේ.

### විසඳුම් 1

මෙම ප්‍රශ්ණය විසඳීම සඳහා නොයෙකුත් ක්‍රම අනුගමනය කලත් සාර්ථක වී ඇත්තේ මඳ වශයෙනි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව පහත සඳහන් ක්‍රම අත්හදා බලා ඇත.

අ. විදුලි වැටක් ඉදි කිරීම

උදා - පැල්වත්තේ උක්වගා භූමියට අලි ඇතුල්වීම වැලැක්වීමත්, උඩවලවේ ජාතික වන උද්‍යානයෙන් අලි පිටතට ඒම වැළැක්වීමත් යන කරුණු දෙකම මෙමගින් ඉටුවේ.

ඒ කෙසේ වුවත් වැට බිඳ දමා ගමන් කිරීමට වල් අලි දැන් පුරුදු වී ඇත.

ආ. අලි වෙසෙන වනාන්තර දෙකක් අතර අලින්ට පිවිසුම් මාර්ග ඇති කිරීමට යෝජනා ඇත. මෙම මාර්ගයන්හි අලින්ට ගමන් කිරීමට නොහැකි වී ඇත්තේ මාර්ග අවහිර වන ආකාරයේ මිනිස් ක්‍රියාකාරකම් පවතින නිසා වේ.

ඇ. ආචාර්ය පෘතිවිරාජ් ප්‍රනාන්දු සහ තවත් කණ්ඩායමක් විසින් යාල ජාතික උද්‍යානයේදී සහ එහි අවට කරන ලද පර්යේෂණයකදී අනාවරණය වූ කරුණක් නම් වර්ෂා සමයේදී හේන් ගොවිතැන සඳහා යොදා ගන්නා බිම වියළි කාලයේදී අලින් ආහාර ගන්නා ස්ථානයක් බවට පත්වන බවයි.

ඈ. විදුලි වැට යොදා වල් අලින් ගම්මායිම්වල රඳවා ගත හැකි නම්, එය සංචාරකයින්ගේ සිත් ඇද ගන්නා දර්ශනයක් බවට පත්කර ගත හැකි වේ. කෙටි ආහාර, අත්කම් භාණ්ඩ සහ සංචාරකයින්ට මාර්ග පෙන්වා දීම මගින් ගම්බද ජනයාට අමතර ආදායමක් ලබා ගත හැකිය.

ඉ. කලබල ඇති කරන අලින් රක්ෂිත ප්‍රදේශ වලට පන්නා දැමිය හැකිය. එවැනි ප්‍රදේශ කිහිපයක් ඇති අතර ආරක්ෂක ප්‍රදේශවල විශාල වශයෙන් අලින් දැකිය හැකිය. තවත් ප්‍රශ්ණයක් වී ඇත්තේ අලින් පන්නා දමන මාර්ගයේ මිනිස් ක්‍රියාකාරකම් විශාල වශයෙන් පවතින හෙයිනි.

ඊ. තවත් ක්‍රමයක් නම් කලබලකාරී අලින් නිර්වින්දන කර කලබල කිරීමට නොහැකි ප්‍රදේශයකට ගෙන යාමයි. එක් වරකට නිර්වින්දනය කල හැක්කේ එක් අලියෙක් පමණි. බලවත් සමාජශීලි බැම්මක් අලින් අතර ඇති හෙයින් රංචුවක එකෙකු හුදකලා කිරීමෙන් ඔවුන් ප්‍රකෝපකාරී වේ. තනි අලින් මෙසේ මාරු කිරීමෙන් ප්‍රශ්න ඇති නොවේ.